# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2245/11 - 2021 සැප්තැම්බර් මස 15 වැනි බදාදා - 2021.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 326 වන වගන්තිය යටතේ කරනු ලබන නියමයයි**

බස්නාහිර පළාත තුළ පිහිටි මහා නගර සභා විසින් කටයුතු කිරීමේදී මහා නගර සභා අරමුදලෙහි මුදල් භාවිතයට අදළ පටිපාටිය නිශ්චය කිරීමෙහිලා 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනත යටතේ විධිවිධාන සලස්වා නොමැති වූ ද ; එම ආඥාපනතේ 289 වගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් හෝ එම ආඥාපනතේ 272 වගන්තිය සමග කියවිය යුතු 267 වගන්තිය යටතේ සාදනු ලබන අතුරු ව්‍යවස්ථා මගින් හෝ 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය යටතේ අදළ වන අතුරු ව්‍යවස්ථාවක් මගින් විධිවිධාන සලස්වා නොමැති කවර හෝ කරුණක් සම්බන්ධයෙන් එවැනි වූ ලිඛිත නීතියක් මගින් විධිවිධාන සලස්වන තෙක් මහා නගර සභා අරමුදලෙහි මුල්‍ය පාලනයට අදළව තීරණය කිරීම, ක්‍රියාත්මක වීම හෝ නොකරහිදීමකට අදළව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය යටතේ විස්තර කරනු ලබන කාර්ය පටිපාටින් බස්නාහිර පළාතේ සියලුම මහා නගර සභා සඳහා අදළ පමණට අදළ විය යුතු බවට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 326 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාර රොෂාන් ගුණතිලක වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නියම කරමි.

තවද සමස්ථ ආර්ථිකයට බලපා ඇති කරුණු සැලකිල්ලට ගනිමින් ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් සෑම මහා නගර සභාවක් විසින්ම සිය අරමුදල භාවිතා කිරීමේදී සාධාරණව හා විචක්ෂනයෙන් යුක්තව පොදු මහජන සුබසිද්ධිය සුරක්ෂිත කිරීමෙහිලා වගකීමෙන් ක්‍රියා කළ යුතු හෙයින් පරිපාලනමය වශයෙන් ඊට කවර හෝ බාධාවක් ඇති නොවන පරිදි පටිපාටිය නිශ්චය කිරීමෙහිලා පැන නැගී ඇති අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම නියමය කරන්නට යෙදුණු බව ද නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝර්ස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2021 සැප්තැම්බර් මස 15 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

10 - 169

1A - G 34951 — 40 (2021/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*